# කෘෂිකර්ම අමාත්‍යාංශය
கமத்தொழில் அமைச்சு
Ministry of Agriculture

නො. 288, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව.
இல. 288, ஸ்ரீ ஜயவர்தனபுர மாவத்தை, ராஜகிரிய, இலங்கை.
No. 288, Sri Jayawardenepura Mawatha, Rajagiriya, Sri Lanka.


මගේ අංකය. / எனது இல. / My No. 7/1/NFS/FS/OC/2018 (1) ඔබේ අංකය. / உமது இல. / Your No. දිනය. / திகதி. / Date. 2018.04.06

ලේකම්,වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
ලේකම්, ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය,
ලේකම්,පරිසර හා මහවැලි අමාත්‍යාංශය,
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්,
අධ්‍යක්ෂ, ජනරාල් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
අධ්‍යක්ෂ,ජාතික පොහොර ලේකම් කාර්යාලය,
සභාපති, ලංකා පොහොර සමාගම,
සභාපති,කොළඹ කොමර්ෂල් පොහොර සමාගම,
ප්‍රධාන විධායක නිලධාරීන් සෘජු පොහොර ආනයන සියලු සමාගම්.

<u>වී හැර අනෙකුත් බෝග සඳහා නව පොහොර සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම</u>

කෘෂිකර්ම අමාත්‍ය ගරු දුමින්ද දිසානායක මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අංක 18/0624/728/021 හා 2018.03.31 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශ සලකා බලා අමාත්‍ය මණ්ඩලය විසින් 2018.03.27 දින දෙන ලද අනුමැතිය පරිදි මෙතෙක් පැවති පොහොර සහනාධාර මුදල් වැඩසටහන වෙනුවට නව පොහොර සහනාධාර වැඩසටහන 2018.04.07 දින සිට බල පැවැත්වෙන පරිදි 2018 යල කන්නය සඳහා ක්‍රියාත්මක වේ.

<u>සහනාධාර ප්‍රතිපත්තිය</u>

1. 2018 යල කන්නය ආරම්භයේ සිට මෙතෙක් පැවති පොහොර මිලදී ගැනීම සඳහා ගොවීන් වෙත සහනාධාර මුදල් පිරිනැමීමේ ක්‍රමවේදය අහෝසි වන අතර ඒ වෙනුවට සහනාධාර මිල ගණන් යටතේ පොහොර මිලදී ගැනීමේ අවස්ථාව ගොවීන්ට හිමි වේ.

2. මේ යටතේ වී හැර අනෙකුත් බෝග සඳහා යූරියා,ටී.එස්.පී,එම්.ඕ.පී හා ඇමෝනියම් සල්ෆේට් යන සෘජු පොහොර 50kg බෑගයක් රු.1500.00 වූ උපරිම සිල්ලර මිලකට ගොවීන් වෙත මිලදී ගත හැක.

3. පෞද්ගලික පොහොර වෙළඳසැල් වලින් සහ දිවයින පුරා පිහිටි පෞද්ගලික පොහොර සමාගම් වල ප්‍රාදේශීය ගබඩා වලින් මෙම සෘජු පොහොර සහනාධාර මිලට ගොවීන් වෙත ලබා ගත හැක.

4. අනෙකුත් බෝග සඳහා ග්‍රැනියුලර් යූරියා අලෙවි නොකළ යුතු අතර ඒවා වී පොහොර සඳහා පමණක් 50kg බෑගයක් රු. 500.00 ක සහනාධාර මුදලකට ගොවිජන සේවා මධ්‍යස්ථාන වලින් පමණක් අලෙවි කළ යුතු වේ.


ලේකම් / செயலாளர் / Secretary — දුරකථන / தொலைபேசி / Telephone - 2868920; ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - sec.agri@yahoo.com; ෆැක්ස් / தொலைநகல் / Fax - 2863497

කාර්යාලය / அலுவலகம் / Office — දුරකථන / தொலைபேசி / Telephone - 2869553, 2872093, 2872097; ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - info@agrimin.gov.lk; ෆැක්ස් / தொலைநகல் / Fax - 2868910